රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

# 2024-06-19 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහුආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුවෙහි (BIMSTEC) සාමාජික රටවල් අතර සමුද්‍රීය ප්‍රවාහන සහයෝගීතාව පිළිබඳ ගිවිසුම**

බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහුආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව (BIMSTEC) විසින් සිය සාමාජික රටවල් අතර සමුද්‍රීය ප්‍රවාහන සහයෝගීතාව පිළිබඳ ගිවිසුමකට එළඹීමට තීරණය කරනු ලැබ ඇත. ඒ සඳහා වන සහයෝගීතා ගිවිසුමට අත්සන් තැබීම පිළිබඳව වන යෝජනාව 2024-01-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමට වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, එකී යෝජනාව සම්බන්ධයෙන් වැඩිදුර කරුණු අධ්‍යයනය කිරීම පිණිස නිලධාරි කමිටුවක් පත් කරන ලදී. ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එකී නිලධාරි කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශයන් ද සැලකිල්ලට ගනිමින් සකස් කරනු ලබන සමුද්‍රීය ප්‍රවාහන සහයෝගීතාව සම්බන්ධයෙන් වන ගිවිසුම අත්සන් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී.

**02. සෘජු ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාව සහ සෞදි අරාබි රාජධානිය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම**

ප්‍රතිපත්ති හා නෛතික ප්‍රතිසංස්කරණ, උසස් හා ඒකාබද්ධ යටිතල පහසුකම් සැපයීම, ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය යනාදිය හරහා රටට සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ දෙරටෙහි ආයෝජන පරිසරය වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ සෞදි අරාබි රාජධානිය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමට දෙපාර්ශ්වය එකඟතාවකට පැමිණ ඇත. ඒ අනුව, 2024-04-28 හා 29 දිනවලදී සෞදි අරාබියේ රියාද්හි පැවති ලෝක ආර්ථික සංසදයේ විශේෂ රැස්වීම අතරතුරදී අදාළ අවබෝධතා ගිවිසුමට විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් අත්සන් තබන ලද බවට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk

www.dgi.gov.lk
www.news.lk

## 03. වර්ජිනියා වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර සහයෝගීතාව

ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපති කාර්යාලය සහ කොළඹ සැලැස්ම මඟින් ඒකාබද්ධව ක්‍රියාවට නංවනු ලබන 'වරාය හා සමුද්‍රීය ප්‍රවීණතා සංවර්ධන වැඩසටහන' යටතේ වරායවල් අතර ප්‍රවීණතාව අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු කර ගැනීමේ සහයෝගීතාව සඳහා වර්ජිනියා වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර සහයෝගීතා ගිවිසුමකට එළඹීමට දෙපාර්ශ්වය අතර එකඟතාවට පැමිණ ඇත. ඒ අනුව, යෝජිත සහයෝගීතා ගිවිසුමට එළඹීම මඟින් දෙපාර්ශ්වයේ විධායක කාර්යමණ්ඩලයේ වෘත්තීය හැකියාවන් වැඩිදියුණු කිරීම ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරනු ලබයි. ඒ සඳහා වන සහයෝගීතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම - 2025

අධ්‍යාපනයේ සමසාධාරණ ප්‍රවේශ අවස්ථා තහවුරු වන පරිදි, විනිවිදභාවයෙන් යුතුව සහ අක්‍රමිකතා අවම වන අයුරින් පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව සිදු කරනු ලබයි. ඒ අනුව, පසුගිය වර්ෂයන්හි ලැබූ අත්දැකීම් මත පදනම්ව දැනට ක්‍රියාත්මක වන චක්‍රලේඛ උපදෙස් සංශෝධනය කිරීමටත්, එකී සංශෝධිත චක්‍රලේඛ උපදෙස් පරිදි 2025 වර්ෂය සහ ඉන් ඉදිරි වර්ෂයන් සඳහා පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. කොළඹ ජාත්‍යන්තර සිනමා උළෙල - 2024

ලාංකීය සිනමා කර්මාන්තයේ පිබිදීමක් ඇතිකරලමින් ගෝලීය සිනමාකරණය මෙරට ප්‍රචලිත කරලීම මෙන්ම ඉහළ සංචාරක ආකර්ෂණයක් දිනා ගනිමින් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ මූලික අරමුණින් 'කොළඹ ජාත්‍යන්තර සිනමා උළෙල' මෙම වර්ෂයේ ජූලි මස 08 දින සිට 14 දින දක්වා කොළඹදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. මෙම සිනමා උළෙල මඟින් ඉරානය, ප්‍රංශය, ඉන්දියාව, දකුණු කොරියාව, චීනය, ජපානය හා ජර්මනිය ඇතුළු රටවල් ගණනාවක දේශීය හා විදේශීය සම්මානයට පාත්‍ර වූ චිත්‍රපට නැරඹීමට ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයින්ට

අවස්ථාව සැලසෙන අතරම, ඒ හරහා සිනමා විද්‍යාර්ථීන්ට ගෝලීය සිනමාකරණය පිළිබඳ පුළුල් අවබෝධයක් හා අත්දැකීම් ලබා ගැනීමේ මහඟු අවස්ථාවක් උදා වනු ඇත. ඒ අනුව, එකී සිනමා උළෙල ජාතික චිත්‍රපට සංස්ථාවේ සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් පැවැත්වීම පිණිස ජනමාධ්‍ය අමාත්‍යතුමා; සහ සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. වතුකරයේ තරුණ සමුළුව

වැවිලි ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් සැපිරීම නිමිත්තෙන් පැවැත්වෙන ජාතික වැඩසටහනේ (NAAM 200) එක් අංගයක් වශයෙන් තරුණ සමුළුවක් පැවැත්වීමට ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඇත. "තරුණ අරුණ" ලෙස නම් කර ඇති එම සමුළුව, තරුණ තරුණියන්ගේ සහභාගිත්වයෙන් 2024-06-22 දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ මහනුවර පරිශ්‍රයේදී පැවැත්වීමට නියමිතව තිබේ. ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් යුතුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සහ තරුණයන්ගේ සහභාගිත්වයෙන් පවතින AIESEC ස්වේච්ඡා සංවිධානයේ සහයෝගයෙන් එම සමුළුව සංවිධානය කරනු ලබයි. මීට සමගාමීව, රැකියා පොළක් පැවැත්වීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය එකඟතාව පළ කර ඇත. ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

## 07. සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙත පරිගණක ආශ්‍රිත දිනුම් ඇදීමේ ලොතරැයි ටිකට්පත් මුද්‍රණය කර සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙත පරිගණක ආශ්‍රිත දිනුම් ඇදීම සඳහා ලග්න වාසනාව, අද කෝටිපති, ශනිදා, සුපර්බෝල්, ජයෝදා, කප්රුක සහ සසිරි යන ලොතරැයිපත් මුද්‍රණය සහ සැපයීම සඳහා ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇත. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය සහ ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ නිර්දේශය මත පදනම්ව වසරක කාලයක් සඳහා ලොතරැයිපත් මුද්‍රණය සහ සැපයීමේ කොන්ත්‍රාත්තුව Toppan Forms (Colombo) Ltd., DPJ Holdings (Pvt) Ltd. සහ Grand Export (Pvt)

Ltd. වෙත පිරිනැමීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්ත - V අංගනයේ ගල් අතුරා තාර දැමීමේ ව්‍යාපෘතිය**

කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්ත - V අංගනයේ ගල් අතුරා තාර දැමීමේ කටයුතුවලට අදාළ සැලසුම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සකස් කරනු ලැබ ඇත. ඒ අනුව, මෙම කාර්යය සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවා සුදුසු ආයතනයක් තෝරා ගැනීමටත්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමටත් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **2015-2019 කාලවකවානුව තුළ "සැමට සෙවණ" නිවාස වැඩසටහන යටතේ ක්‍රියාත්මකව අවිච්ඡේද වූ වැඩසටහන් නැවත ක්‍රියාත්මක කිරීම**

2015-2019 කාලවකවානුව තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් "සැමට සෙවණ" නිවාස වැඩසටහන යටතේ නිවසක අවශ්‍යතාව ඇති හා නිවාසවල ඉදිකිරීම් ආරම්භ කර වැඩ අවසන් කිරීමට නොහැකි වූ අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කරගනිමින් ආදර්ශ ගම්මාන වැඩසටහන, විසිරි ණය වැඩසටහන, ග්‍රාමශක්ති විසිරි ආධාර, විසිරි ණය ආධාර, විරුසුමිතුරු, වකුගඩු රෝගීන් සඳහා නිවාස ආධාර වැඩසටහන සහ ගංවතුර වැඩසටහන ආදී වශයෙන් නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එකී වැඩසටහන් යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස ඒකක 387,520ක ප්‍රමාණයකින් නිවාස ඒකක 229,580ක ඉදිකිරීම් අවිච්ඡේද වී ඇති අතර, රාජ්‍ය නොවන සංවිධාන විසින්, විවිධ ආධාර මඟින් හා ප්‍රතිලාභීන් විසින් එකී නිවාසවලින් කොටසක් ඉදි කර අවසන් කර ඇත. ඒ අනුව, තවදුරටත් වැඩ අවසන් වී නොමැති නිවාස ඒකක 45,117ක ඉදිකිරීම් කටයුතු ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මැදිහත් වීම මත ප්‍රමුඛතාව මත පදනම්ව අදියර වශයෙන් අවසන් කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ජාතික හැඳුනුම්පත් මුද්‍රණය කිරීම සඳහා පෙර-මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිල දී ගැනීම**

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා හැඳුනුම්පත් මුද්‍රණය කිරීම පිණිස අවශ්‍ය පෙර-මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිලියන 05ක් මිල දී ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය සහ ඒ පිළිබඳව වන ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් එකී ප්‍රසම්පාදනය අවලංගු කිරීමට 2024-05-06 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. එමෙන්ම, ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි වන පරිදි, නව ප්‍රසම්පාදනයක් ක්‍රියාත්මක කර සුදුසු සැපයුම්කරුවෙකු තෝරාගනු ලබන තෙක් පෙර-මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් අත්‍යවශ්‍ය ප්‍රමාණය පමණක් පෙර සැපයුම්කරුගෙන් නැවත ඇණවුමක් වශයෙන් ලබා ගැනීම සඳහාත් එම අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, පෙර සැපයුම්කරු වෙතින් මිල දී ගත යුතු කාඩ්පත් ප්‍රමාණය සම්බන්ධයෙන් අදාළ නිර්දේශ ලබා ගැනීමට හා සැපයුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන මිල යෝජනාව ඇගයීම සඳහා ව්‍යාපෘති කමිටුවක් සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කරනු ලැබ ඇත. එකී කමිටුවල නිර්දේශ මත පදනම්ව පෙර සැපයුම්කරු වන Just In Time Technologies (Pvt) Ltd. වෙතින් නැවත ඇණවුමක් වශයෙන් පෙර-මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිලියන 2.3 ක් මිල දී ගැනීම පිණිස මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **2024 යල කන්නය සඳහා වී මිල දී ගැනීම පිණිස සහනදායී පොලී අනුපාතයක් යටතේ බැංකු හරහා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම**

2023/24 මහ කන්නය සහ 2024 යල කන්නයේ වී මිල දී ගැනීම සඳහා සහනදායී පොලී අනුපාතයක් යටතේ බැංකු මඟින් ඔඩපණ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස 2024-01-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ යටතේ 2024 යල කන්නයේ වී මිල දී ගැනීම සඳහා ඔඩපණ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් අනෙකුත් අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය

සහ පෞද්ගලික බැංකු නියෝජිතයින් සමඟ සාකච්ඡාවක් පවත්වා ඇත. එම සාකච්ඡාවේදී එළඹ ඇති එකඟතාවන්ට අනුව 2024 යල කන්නයේදී සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්, වී ගබඩා හිමිකරුවන් සහ වී තොග රැස් කරන්නන් වෙත සහභාගිත්ව බැංකු ආයතන හරහා රුපියල් මිලියන 6,000ක ඔඩපණ ණය සහනදායී පොලී අනුපාතයක් මත නිකුත් කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ අනෙකුත් පියවර ගැනීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************